www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*2010 ජනාධිපතිවරනය සඳහා සසප ප්‍රකාශනය*

*SEP manifesto for the 2010 presidential election*

# සමාජ සමානතාව සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් උදෙසා සටන් වැදීමට සමාජවාදී වැඩපිලිවෙලක්

## A socialist program to fight for social equality and democratic rights

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**

**2010 ජනවාරි 04**

2010 ජනවාරි 26 දා පැවැත්වෙන ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනය සඳහා තරග වදින අපගේ අපේක්ෂක විජේ ඩයස්ට සහයෝගය දෙන ලෙසත් අපගේ මැතිවරන උද්ඝෝෂනයට සහභාගි වන ලෙසත් සමාජවාදී සමානතා පක්ෂය (සසප) කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටී. 68 හැවිරිදි ඩයස්, සසප ප්‍රධාන ලේකම් මෙන්ම ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකි. ඔහු සිය සමස්ත වැඩිහිටි දිවිය ම කැප කොට ඇත්තේ විප්ලවවාදී මාක්ස්වාදය සඳහා සටන් වැදීම උදෙසා ය.

මෙම මැතිවරනයේ දී වැඩ කරන ජනතාව මුහුන දෙන එක් ප්‍රධාන ගැටලුවක් පවතීඃ එනම්, ආන්ඩුව සහ දෙමල බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර පැවති 26 අවුරුදු සිවිල් යුද්ධයෙන් අත්පත් කරගත් දෙය ලෙස පෙන්වීමට ඇත්තේ කුමක්ද යන්නය. 70,000ක් දෙනා මියගොස්, තවත් ලක්ෂ ගනනක් අවතැන් වී හෝ රැඳවුම් කඳවුරුවල සිරගත කෙරී ඇත. මිලියන ගනනක් තවමත් දුප්පත්කමේ ඇලීගැලී සිටින අතර සිංහල හා දෙමල ප්‍රජාවන් අතර ආතතිය තවත් උග්‍ර කර ඇත. ශ්‍රී ලංකාවේ පාලක පන්තියේ ඉවබව නැති ජාතිවාදී දේශපාලනය වෙනුවෙන් ගෙවීමට සිදුව ඇති භයංකර වන්දිය එයයි.

ප්‍රධාන ජනාධිපතිවරන අපේක්ෂකයන් වන ජනාධිපති මහින්ද රාජපක්ෂට සහ ජෙනරාල් සරත් ෆොන්සේකාට යුද අපරාධවල ද ප්‍රජාතන්ත්‍ර අයිතීන් අමුඅමුවේ ම උල්ලංඝනය කිරීමේ ද වගකීමෙන් මිදිය නොහැකි ය. 2006 ජුලි මස යුද්ධය යලි ඇරඹූවේ රාජපක්ෂ ය. ජෙනරාල් ෆොන්සේකා එය ක්‍රියාවට දැමීය. මිලිටරියේ ඉවබවක් නැති බෝම්බ හා ෂෙල් ප්‍රහාර වලින් සිවිල් වැසියන් දහස් ගනනින් ඝාතනය කරන ලදී. එල්ටීටීඊයේ පරාජයෙන් පසුව, මිනිසුන්, ගැහැනුන් හා ලමුන් 280,000ක් සිරගත කෙරුනි. ආරක්ෂක හමුදාවල සහයෝගය ඇතිව දිවයින පුරා ක්‍රියාත්මක වූ ඝාතක කල්ලි සිය ගනනක් පැහැරගෙන ගියහ; ඝාතනය කලහ.

රාජපක්ෂ යුද වියදම් පිනිස රට මුලුමනින්ම උගසට තබා ඇත. මැතිවරනය හමාර වූ වහාම, පසුගිය ජූලි මස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ශ්‍රී ලංකාව ලබාගත් නයෙහි කොන්දේසිවලට අනුව රාජ්‍ය වියදම් දැවැන්ත ලෙස කප්පාදු කිරීමට ආන්ඩුවට බලකෙරුනු ඇත. කප්පාදුවට එරෙහිව නොවැලැක්විය හැකි ලෙස වැඩෙන දේශපාලන විරුද්ධත්වය මඩිනු පිනිස සිවිල් යුද්ධය තුල දී සකසා ගත් පොලිස්-රාජ්‍ය විධික්‍රම එය යොදා ගනු ඇත.

සසප, ධනේශ්වරයේ සියලු නියෝජිතයන්ට හා ක්ෂමාලාපකයන්ට එරෙහිව කම්කරු පන්තිය බලමුලු ගැන්වීම සඳහා උද්ඝෝෂනය කරයි. දකුනු ආසියාවේ හා සමස්ත ගෝලීය පරිමාන සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක රූපයෙන් කම්කරු-ගොවි ආන්ඩුවක් ගොඩනැගීම පිනිස අපි සටන් වදිමු.

### වර්ගෝත්තමවාදයේ බංකොලොත්කම

යුද අපරාධ ද ජාතික සුලුතරයන් පාගාලීම ද මගින් සාක්ෂාත් කරගැනුනු අඩමාන සාමය කිසිවක් විසඳලනු නැත. ආන්ඩුව සිවිල් යුද්ධය ගෙනගිය කෘෘර ආකාරය තුලින් සිදු කර ඇත්තේ වාර්ගික ආතතීන් හා ඝට්ටන අලුත් මුහුනුවරින් යලි පැනනැගීම ය.

මේ රටේ එක් මුලු පරම්පරාවක්ම වැඩී ඇත්තේ යුද්ධය හා පොලිස්-රාජ්‍ය මර්දනය හැර අන් යමක් නොදැක ය. බලය බෙදාගැනීමේ ගිවිසුම් හරහා සාමය සාක්ෂාත් කරගැනීමේ සියලු ප්‍රයත්නයන්, මීට 60 වසරකට පෙර නිදහස ලැබූ දා පටන් මේ දක්වා ශ්‍රී ලංකාවේ ධනේශ්වර පාලනයේ පදනම සකසා ඇති වාර්ගික දේශපාලනය හමුවේ බිඳ වැටුනි. රාජපක්ෂ සහ ෆොන්සේකා ඉදිරිපත් කරන "විසඳුම" නම් අන් කිසිවක් නොව මිලිටරිය උතුරු හා නැගෙනහිර පලාත්වල සදාකාලිකව පැලපදියම් කිරීම ද දිවයින පුරා පොලිස්-රාජ්‍ය ක්‍රම ක්‍රියාවට දැමීම ද වේ.

එමෙන්ම, යුද්ධයේ අවසානය, ශ්‍රී ලංකාවේ උතුරේ වෙනම දෙමල ධනපති රාජ්‍යයක් ගොඩනැගීම පිලිබඳ එල්ටීටීඊයේ ඉදිරිදර්ශනය කුඩුපට්ටම් කර දමා ඇත. එල්ටීටීඊයේ ජනවර්ග-පාදක වැඩපිලිවෙල, විසින් සිදු කරන ලද්දේ තමිල්නාඩුවේ හා ඉන්දියාවේ සෙසු ප්‍රදේශවල කම්කරුවන්ට තබා සිංහල කම්කරුවන්ට වත් ආයාචනා කිරීමේ හැකියාව එල්ටීටීඊයට නැති කර දැමීමය. සිංහල සිවිල් වැසියන්ට එරෙහි එල්ටීටීඊයේ ලේවැකි ත්‍රස්ත ප්‍රහාරයන්ට යටින් පවතින්නේ ද එම ජාතිවාදයයි. සියලු දේශපාලන විරුද්ධවාදීන් රුදුරු ලෙස මැඩීමේ එල්ටීටීඊයේ පිලිවෙත මගින් ප්‍රකාශයට පත්වූ එහි ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය, දෙමල ජනයා එයින් තව දුරටත් විරසක කොට අවසානයේ ඔවුන්ගේ සහයෝගය නැතිකර දැමීය.

එල්ටීටීඊයේ දේශපාලනය, විසින් එය ජාත්‍යන්තර ධනේශ්වරයේ දේශපාලන සුලං-මාරු වලට - විශේෂයෙන් ම 2001 සැප්තැම්බර් 11 ප්‍රහාරයන්ට පසුව එක්සත් ජනපදය ප්‍රෝඩාකාරී "ත්‍රස්ත විරෝධී යුද්ධයක්" ප්‍රකාශයට පත් කිරීමට, එය ගොදුරු කලේය. ඉන්දියාව සහ එක්සත් ජනපදය, ශ්‍රී ලංකාව හා ඉන්දියානු සාගරය තුල නැගෙන චීන බලපෑම පිලිබඳව වඩවඩා කලබල වීමත් සමග, ශ්‍රී ලංකාවේ යුද්ධය තව දුරටත් තමන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන්නේ නැති බවක් මහ බලවත්තු තීන්දු කලෝය. එල්ටීටීඊයට එරෙහි තමන්ගේම රුදුරු "ත්‍රස්ත විරෝධී යුද්ධය" යුක්තියුක්ත කරනු පිනිස රාජපක්ෂ එල්ටීටීඊයේ ත්‍රස්ත ප්‍රහාර ඩැහැගත් කල ඔවුහු සියල්ලෝම එයට සහයෝගය දුන්හ.

## දකුනු ආසියාව තුල මහ බලවතුන්ගේ පොරය

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසානය සාමය ගෙන එනු නැත. ඇත්ත වශයෙන්ම එය වනාහී අනිවාර්යයෙන් ම කලාපය හා ලෝකය පුරා තවතවත් ගැටුම් නිර්මානය කරනු ඇති ලෝක දේශපාලනයේ අර්බුදයේ අතිඋග්‍ර භාවය පිලිබඳ පෙර ඇඟැවුමක් ලෙස සැලකිය යුතුය. 2008 සැප්තැම්බරයේ දී පැනනැගි ගෝලීය මූල්‍ය අර්බුදය තුල ප්‍රකාශනය අත්පත් කරගත් ධනපති ක්‍රමයේ අශමනීය ප්‍රතිසතිතා ජාත්‍යන්තර සබඳතා ප්‍රගාඪ ලෙස අස්ථාවර කර තිබේ.

මෙම තත්වයට ඇමරිකා එක්සත් ජනපදය දක්වා ඇති ප්‍රතිචාරය, ඇෆ්ඝනිස්ථානය තුල සිය හමුදා ශක්තිය වහාම ඉහල දැමීම පිලිබඳව ඔබාමා පාලනාධිකාරය කල මෑත නිවේදනය ද ඉස්ලාම් කැරලිකරුවන්ට එරෙහි ප්‍රහාර උත්සන්න කරන ලෙස එය පකිස්ථානය මත යොදන පීඩනය ද මගින් පෙන්නුම් කෙරෙයි. "ත්‍රස්ත විරෝධී යුද්ධයක්" පිලිබඳ ප්‍රෝඩාකාරී කඩතුරාවට පිටුපසින්, එක්සත් ජනපදය උත්සාහ කරන්නේ, සිය ප්‍රධාන ප්‍රතිවාදීන්ට, විශේෂයෙන් චීනයට, එරෙහිව ලෝක දේශපාලනයේ බේරුම්කරුවා ලෙස සිය ක්‍රියාකලාපය පවත්වාගෙන යනු පිනිස, තත්වය සකසා ගැනීම ය; ඒ සඳහා  මධ්‍යම ආසියාවේ හා මැද පෙරදිග බල ශක්ති සම්පත්වලින් පොහොසත් කලාප තුල මූලෝපායික පදනමක් තහවුරු කරගැනීම ය. රට තුල හා එතෙර ජනතා විරෝධයට ලක්ව ඇති එහි ආක්‍රමනික යුදවාදය, ආගමික හා ජනවාර්ගික සතුරුකම් මගින් දැනටමත් ඉරිතලා ඇති සමස්ත ඉන්දු උප මහාද්වීපයම අස්ථාවර කරමින් සිටී.

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අවසන් වූයේ මෙම සන්දර්භය තුලය. රාජපක්ෂ තැත් කලේ තම වාසිය තකා එක් ලෝක බලවතෙකුට එරෙහිව තවත් මහ බලවතෙක් යොදාගැනීම ය. යුද අපරාධ පිලිබඳ විමර්ශන පැවැත්විය යුතු යයි එක්සත් ජනපද හා යුරෝපා බලවතුන් කල ඉල්ලීම්වලට එරෙහිව ඔහු චීනයේ අවි, මූල්‍ය සහයෝගය හා රාජ්‍යතාන්ත්‍රික සහාය මත බොහෝ සෙයින් වාරු විය. එයට හිලව් වසයෙන්, ඔහු, හම්බන්තොට ප්‍රධාන වාරය පහසුකමක් ද ඇතුලුව, චීන ආයෝජනවලට ප්‍රමුඛතා මට්ටමේ සැලකිල්ලක් ලබා දී තිබේ. ශ්‍රී ලංකාව තුල චීනයේ වැඩෙන බලපෑම පිලිබඳ බිය, රාජපක්ෂ යලි ඇරඹූ යුද්ධයේ දී ඔහුට පිටුබලය සැපයීමෙහිලා ඉන්දියාව හා එක්සත් ජනපදය ගත් තීන්දුවට සැලකිය යුතු පරිදි බලපෑවේ ය.

රාජපක්ෂගේ උපාමාරු මගින් සිදු කර ඇත්තේ ධනවාදී සමස්ත ලෝක පර්යායම කැබලිකර ඉරා දමමින් තිබෙන තියුනු ජාත්‍යන්තර ගැටුම් මැද්දෑවට ශ්‍රී ලංකාව තව දුරටත් ඇද දැමීම වේ. මෑත එක්සත් ජනපද සෙනෙට් විදේශ සබඳතා කමිටු වාර්තාවක්, ආසියාව සහ යුරෝපය, මැද පෙරදිග හා අප්‍රිකාව අතර, ඉන්දියානු සාගරයේ මුහුදු මාර්ගවල "කේන්ද්‍රයේ" පිහිටා ඇති, ශ්‍රී ලංකාවේ මූලෝපායික වැදගත්කම අවධාරනය කලේය. එම වාර්තාව සිය ප්‍රතිවාදීන් හමුවේ "ශ්‍රී ලංකාව නැති කර" නොගැනීමට ඇති වොෂිංටනයේ අධිෂ්ඨානය ප්‍රකාශයට පත් කලේය. එක්සත් ජනපදය මුහුන පා සිටින "භූ-මූලෝපායික යථාර්ථයන්" සැලකිල්ලට ගන්නා "බලගතු ප්‍රවිෂ්ටයක්" උවමනා බව ද මානුෂීය ගැටලු" පිලිබඳ මීට පෙරාතු කාලයේ දැක්වූ ව්‍යාජ උත්සුකය අතහැර දැමිය යුතු යයි ද එම වාර්තාව කල අවධාරනය නපුරු අර්ථයක් ගැබ්කර ගනී.

## පන්ති අරගලයේ පුනර්ජීවනය

ලොව පුරා සිටින තම පීඩිත පන්ති සහෝදරසහෝදරියන් මෙන් ම, ශ්‍රී ලංකාවේ කම්කරුවෝ ද සිය ජීවන තත්වයන් හා අයිතීන්ට එල්ල කෙරෙන උග්‍ර ධනපති ප්‍රහාරයකට මුහුන දී සිටිති. ගෝලීය මූල්‍ය අර්බුදය ශ්‍රී ලංකාවේ දී, සිවිල් යුද්ධය මගින් විනාශභාග් කෙරුනු ආර්ථිකයට තවතවත් උග්‍ර ප්‍රහාර එල්ල කරමින් සිටී. ලංකාවේ රාජ්‍ය නය දැන් රුපියල් ට්‍රිලියන 4.1, එනම් දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 90කටත් ඉහල මට්ටමක් දක්වා, නැග තිබේ. මෙයට ප්‍රමුඛතම හේතුව බවට පත්වී ඇත්තේ විනාශකාරී සිවිල් යුද්ධයයි.

කම්කරුවන් අතර වැඩෙන අතෘප්තිය හා වෛරය යුද්ධය අවසන් වනවාත් සමග ම වතුකරයේ, වරායේ සහ ඛනිජ තෙල්, විදුලි බල හා ජල සම්පාදන අංශවල අරගල යලි පැනනැංවීය. මේ සෑම අවස්ථාවක දී ම, ආන්ඩුවට හිතැති හා විරුද්ධ පක්ෂවලට හිතැති සමිති එකාවන්ව, සිය සාමාජිකයන්ගේ මොන යම් හෝ ස්වාධීන අරගලයක් මඩිනු පිනිස මැදිහත් වූහ. ඔවුහු රාජපක්ෂ ආන්ඩුවට එරෙහි මොන යම් හෝ දේශපාලන අරගලයකට දැඩි ලෙස විරුද්ධ වී ආන්ඩුවේ තර්ජනවලට යටත් වී සිය සාමාජිකයන් පාවා දුන්හ.

රාජපක්ෂ වර්ජක කම්කරුවන්ට එරෙහිව හමුදාව යොදවා, කම්කරු අරගල තහනම් කිරීමට හදිසි නීති බලතල පාවිච්චි කොට මාධ්‍ය විවේචකයන්ට එරෙහි නැවතනැවතත් පහර එල්ල කලේ ය. රාජපක්ෂ දැන් ඉදිරිපත් කර ඇති, යුද්ධයෙන් පසු "ජාතිය ගොඩනැගීමේ" වැඩපිලිවෙල, මගින් සිදු කර ඇත්තේ දිවයින විදේශ ආයෝජකයන් සඳහා නව ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කිරීම සඳහා වෙලඳ පොල හිතැති ප්‍රතිව්‍යුහකරනය හා පුද්ගලීකරනය වේගවත් කිරීම වේ. ඊලඟ ආන්ඩුව (රාජපක්ෂගේ වේවා ෆොන්සේකාගේ වේවා) ලංකාව "ජාත්‍යන්තරව තරගකාරී" කරනු පිනිස වැටුප් මට්ටම් හා රාජ්‍ය වියදම් කප්පාදු කිරීමට උත්සාහ කරනු ඇත. ගෝලීය ආර්ථික අර්බුදය නිසා කම්කරු පන්තිය දිලිඳු බවට ඇද දමා පරිභෝගය පහත වැටී දැනටමත් විනාශ වී ඇති බටහිර යුරෝපීය වෙලඳ පොලවලට ප්‍රවිෂ්ට වීම පිනිස ආසියානු රටවල් කා වැටෙන තතු තුල, මෙවන් ප්‍රහාර විශේෂයෙන් ම දරුනු වනු ඇත.

දුප්පත්කමට සහ ලෝක යුද්ධ තර්ජනයට එරෙහිව කම්කරුවන්ට ආරක්ෂාවීගත හැක්කේ ලාභ ගැරීම සඳහා අරමුනු කරගත් යල්පැනගිය ජාතික රාජ්‍ය පද්ධතියට එරෙහිව සමස්ත ජාත්‍යන්තර කම්කරු පන්තිය බලමුලුගන්නාලන සමාජවාදී මූලෝපායකින් පමනක් බව සසප අවධාරනය කර සිටී.

සිය වැටුප් අරගලය මධ්‍යයේ දී, ආගරපතන බැල්මෝරල් වත්තේ කම්කරුවෝ, සසප දේශපාලන සහයෝගය සහිතව, වෘත්තීය සමිතිවලින් ස්වාධීනව, තමන්ගේම ක්‍රියාකාරී කමිටුවක් ගොඩනගාගෙන, එම ආස්ථානයම ගන්නා ලෙස කම්කරු පන්තියේ සෙසු කොටස්වලින් ද ඉල්ලා සිටියහ. ඔවුන්ගේ ක්‍රියාව, කම්කරු පන්තිය වෘත්තීය සමිතිවලින් බිඳී, ලාභ ගරන ක්‍රමයට හා එහි ආරක්ෂකයන්ට එරෙහිව දේශපාලන අරගලයක් සඳහා බලුමුලුගැන්වීම දෙසට තබන වැදගත් පලමු පියවරක් නියෝජනය කලේය.

සසප ඉල්ලීම්

● උතුරේ හා නැගෙනහිර මිලිටරි වාඩිලෑම අවසන් කිරීම සඳහා

ධනපති පාලනයට එරෙහි පොදු අරගලයක් තුල දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරුවන් ඒකාබද්ධ කරනු වස්, උතුරේ හා නැගෙනහිර මිලිටරි වාඩිලෑම වහාම අවසන් කරන ලෙසත් සියලු රැඳවියන් නිදහස් කරන ලෙසත් සසප ඉල්ලා සිටී. අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී විසඳුමක් සඳහා පදනම නිර්මානය කරනු පිනිස, නොවිසඳී පවතින සියලු ප්‍රජාතන්ත්‍ර ගැටලු විසඳලන නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනු සඳහා ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් කැඳවීමට සසප ඉල්ලා සිටී. එවන් මන්ඩලයක් සංවිධානය හා තෝරා පත් කිරීම කල යුත්තේ වැඩ කරන ජනතාව විසින් වන අතර එය අව්‍යාජ, ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහතික කරනු පිනිස සියලු වෙනස්කම් කිරීමේ නීති අහෝසි කල යුතුය.

● සියල්ලන් සඳහා සුරැකි හා මනා වැටුප් සහිත රැකියා

මනා වැටුප් සහිත රැකියා ලක්ෂ ගනනින් නිර්මානය කිරීම සහ පොදු නිවාස, පාසල්, රෝහල්, සංස්කෘතික හා ක්‍රීඩා පහසුකම්, මංමාවත් හා වාරිමාර්ග ව්‍යාපෘති ඉදි කිරීම පිනිස, පොදු වැඩ සඳහා රුපියල් බිලියන ගනනින් සම්පාදනය කල යුතුය. ඉහල යන බඩුමිල ඉදිරියේ වැටුප් හීනවීයෑම වලකා ජීවන වියදම වැඩිවීම පරයා වැටුප් ඉහල යාම තහවුරු කොට ඒ සමග ම වැඩ සතිය පැය 30 දක්වා අඩු කිරීම මගින් රැකියා මහත්සේ වැඩි කල යුතුයයි සසප යෝජනා කර සිටී. ලමා ශ්‍රමය ද රාත්‍රී වැඩ මුරවල කාන්තාවන් හා තරුනයන් යොදාගැනීම ද අවසන් කරන ලෙස අපි ඉල්ලා සිටිමු. අවශ්‍ය සම්පත් ලබාගනු පිනිස, සියලු විශාල බැංකු හා මූල්‍ය ආයතන ජනසතු කල යුතු ය. නිදහස් වෙලඳ කලාපවල පිහිටි ආයතන ඇතුලු සියලු ප්‍රධාන කාර්මික සංගත පොදු අයිතියට යටත්කොට ප්‍රජාතාන්ත්‍රිකව පාලනය වන ආයතන බවට පරිවර්තනය කල යුතුය.

● නිදහස් හා ඉහල ගුනාත්මක භාවයෙන් යුක්ත අධ්‍යාපනයක්

අසමානතාව මගින් වර්තමාන අධ්‍යාපන ක්‍රමය ඉරිතලා ගොස් ඇත. කම්කරු පන්තික හා ග්‍රාමීය ප්‍රදේශවල දරුවන් උපකරන හා කාර්ය මන්ඩල හිඟයෙන් පෙලෙන රජයේ පාසල්වලට ගොදුරුව ඇති අතර ධනවතුන්ගේ දූපුත්තු පුද්ගලික පාසල්වල නවීන සම්පත් ද විධික්‍රම ද තාක්ෂන ද භුක්ති විඳිති. සිය අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අවශ්‍ය සියලු දෙනාට, විශ්වවිද්‍යාල මට්ටම දක්වා. නිදහස්, ඉහල ගුනාත්මක භාවයෙන් යුක්ත අධ්‍යාපනයක් ලබා දෙනු පිනිස, රජයේ පාසල් පද්ධතිය පුලුල් ලෙස ප්‍රසාරනය කල යුතු යයි සසප ඉල්ලා සිටී. විද්‍යාගාර, පරිගනක පහසුකම් සහ නවීනතම ශ්‍රව්‍ය-දෘශ්‍ය උපකරන මෙන් ම ක්‍රීඩා සහ කලා පහසුකම්වලට ද ලබා දී, පවත්නා ආයතන වැඩිදියුනු කල යුතුය.

● සාර්වත්‍රික සෞඛ්‍ය සේවාවක් සඳහා

ඩෙංගු, මැලේරියා, කම්මුල්ගාය හා ක්ෂය රෝගය වැනි වලකාගත හැකි රෝගවලින් සෑම වසරකම දහස් ගනනින් මිය යන අතර සූකර උන හා කුරුලු උන වැනි නව ලෙඩරෝග පැතිරෙමින් පවතී. යමක් කමක් ඇති අය පුද්ගලික වෛද්‍යවරුන් හා සායන වෙත යන අතර, මහජනතාව එන්න එන්නම අරමුදල් හිඟයෙන් පෙලෙන රජයේ සෞඛ්‍ය සේවාව මත රඳාපවතී. නිදහස්, සාර්වත්‍රික, ඉහල ගුනාත්මක භාවයෙන් යුක්ත සෞඛ්‍ය සේවාවක් සම්පාදනය කරනු පිනිස, මනා හා ප්‍රමානවත් උපකරන හා කාර්ය මන්ඩලවලින් සමන්විත රජයේ රෝහල් හා සායන වර්ධනය කල යුතු යයි සසප ඉල්ලා සිටී.

● සියල්ලන්ටම යහපත් නිවාස

බොහෝ පවුල් නල ජලය, විදුලිය හා මනා වැසිකිලි පහසුකම් වැනි මූලික පහසුකම් නොමැති ප්‍රමිතියෙන් බාල නිවාසවල ජීවත් වන අතර, නිවාස කුලී ඉහල දැමීමට ද දොට්ට දැමීමේ තර්ජනයන්ට ද මුහුන දී සිටිති. සියල්ලන් සඳහා යහපත් නිවාස පහසුකම් සපයනු පිනිස, සියලු අත්‍යවශ්‍ය උපයෝගිතා සේවාවන් සහිත, දැරිය හැකි පාලනය කෙරුනු කුලියක් සහිත රාජ්‍ය නිවාස ගොඩනැගිය යුතු යයි සසප ඉල්ලා සිටී.

● කාන්තා කම්කරුවන් පීඩාවට පත් කිරීම අවසන් කරනු

කාන්තා කම්කරුවන්ට බල කෙරී ඇත්තේ අඩු වැටුප් සහිත රැකියා සහ ගෘහස්ත කැඹීරීම යන දෙගුනයක බරට කරගැසීමට ය. ඔවුහු ඇඟලුම් කම්හල්වල, තේ දලු නෙලීම, රබර් කිරි කැපීම හා සෙසු කෘෂිකාර්මික වැඩ වැනි ඉතාමත් බර වැඩවලට කර ගසති. ගෝලීය ආර්ථික අර්බුදය, කාන්තා ඇඟලුම් කම්කරුවන් දස දහස් ගනනින් දොට්ට ඇදදමා ඇත. ලෝක ආර්ථික බිඳවැටීම මැද පෙරදිගට පහර දෙන තතු යටතේ එතෙර සේවය කරන ගෘහ සේවිකාවන්ගේ හෝ සුලු සේවිකාවන්ගේ රැකියා හෝ ආදායම අහිමි කර දමමින් තිබේ.

නොමිලේ සැපයෙන ඉහල ගුනාත්මක භාවයෙන් යුතු ලමා සුරැකුම් සේවා සහ සම්පූර්න වැටුප් සහිත මාතෘ නිවාඩු ද එමෙන් ම සමාන වැටුප් හා කොන්දේසි ද සඳහා කාන්තා කම්කරුවන්ට ඇති අයිතිය සසප ආරක්ෂා කරයි. විවාහ නීති තුල පවත්නා තතු ද ඇතුලු ලිංග භේදය මත වෙනස්කම් කිරීම් අහෝසි කල යුතු යයි අපි ඉල්ලා සිටිමු. ගබ්සාව නීතිගත කොට සියලු දෙනා සඳහා එම පහසුකම් නොමිලේ ලබාගැනීමේ අවස්ථාව දිය යුතුය. පිරිමින්ට හා කාන්තාවන්ට එකසේ සිය දක්ෂතා හා පෞරුෂයන් පරිපූර්නව වර්ධනය කරගත හැකි වන, ප්‍රබුද්ධ සංස්කෘතික වාතාවරනයක් ප්‍රවර්ධනය කරනු වස් සසප ප්‍රයත්න දරයි.

● කුඩා ගොවීන්ට ආධාර කරනු

ඉඩම් නැතිකම බොහෝ කුඩා ගොවීන්ට බලපාන අතර මෙම ගැටලුව සිවිල් යුද්ධය අවුලුවාලීමෙහිලා සැලකිය යුතු ක්‍රියාකලාපයක් ඉටු කර තිබේ. මෙතෙක් පැවති සියලු ආන්ඩු, වාර්ගික ආතතීන් උත්සන්න කරමින්, දෙමල බහුතරයක් සහිත ප්‍රදේශවල, එනම් උතුරේ වන්නි ප්‍රදේශයේ හා නැගෙනහිර, ගොවිජනපද යයි ඉඩම් අහිමි සිංහල දුගීන් හිතමතාම පදිංචි කලහ. යුද්ධයේ අවසානයත් සමග, මෙම පිලිවෙත් යලි පනගස්සමින් තිබේ. කුමන ජාතියකට වුවද අයත්, ඉඩම් නැති සියලු ගොවීන්ට රජයේ ඉඩම් බෙදා දිය යුතු යයි සසප ඉල්ලා සිටී. දුගී ගොවීන්ගෙන් හා ධීවරයන්ගෙන් අය විය යුතු සියලු පරන නය අහෝසි කල යුතු අතර නය, ගොවි උපකරන, පොහොර හා කෘෂි රසායනික සහ ධීවර ආම්පන්න දැරිය හැකි කොන්දේසි යටතේ ලබා දිය යුතුය.

## කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය උදෙසා

ශ්‍රී ලංකාවේ අවුරුදු විසිහයක් පුරා පැවති සිවිල් යුද්ධය විසින් ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායේ මූලික ප්‍රස්තුතයක් සනාථ කෙරේ: එනම්, ධනේශ්වර වර්ධනය කල් පසුවූ රටවල ධනපති පන්තිය මූලික ප්‍රජාතන්ත්‍ර කර්තව්‍යයන් ඉටු කිරීමෙහිලා ඓන්ද්‍රීයවම අසමත් බවයි. සමාජය සමාජවාදී ලෙස ප්‍රතිසංවිධානය කිරීමේ අරගලය තුලදී පීඩිත මහජනතාව තමන් වටා රැලි කරගන්නා කම්කරු පන්තිය පමනක්ම, සියල්ලන් සඳහා සාමය සහ අව්‍යාජ ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහතික කිරීමට සමත් වනු ඇත. මෙය සිදු කල හැක්කේ, මහජනතාව ධනේශ්වරයට ගැටගසන සියලු දේශපාලන බලවේගවලින් අතිමූලිකව බිඳීමක පදනම මත පමනි.

ධනේශ්වර පක්ෂ රාජපක්ෂ හෝ ෆොන්සේකා පිටුපස පෙලගැසෙන තතු යටතේ, ශ්‍රී ලංකාවේ ධනේශ්වරය පෙර කිසිදාක මෙතරම් දේශපාලනිකව එලිදරව් වී සිටියේ නැත. පැවති වාමාංශික පක්ෂ වන ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සහ ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය රාජපක්ෂ පිටුපස දෘඩතරව පෙල ගැසී සිටින අතර ජවිපෙ සිංහල ස්වෝත්තමවාදය එහි පරිපූර්න ප්‍රකාශනය අත්පත් කරගෙන ඇත්තේ, දක්ෂිනාංශික එජාපය සමග පෙල ගැසී, ෆොන්සේකාට තම පක්ෂය සහයෝගය පිදුම තුලිනි. මැයි මස වන තෙක් එල්ටීටීඊයේ හොරනෑව ලෙස සිටි දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ), සිය සහයෝගයට හිලව් වසයෙන් හොඳම ගතමනාව ලබාගත හැක්කේ යුද අපරාධවලට වගකිවයුත්තේ දෙදෙනාගෙන් කාගෙන් ද යන වග සොයා ලැබීමේ කැත රහස් කතිකාවල යෙදී සිටී.

කෙසේවෙතත්, වඩාත්ම තුච්ඡ ක්‍රියාකලාපය වැටී ඇත්තේ, පිලිවෙලින් වික්‍රමබාහු කරුනාරත්න සහ

සිරිතුංග ජයසූරිය අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් කරන නව සමසමාජ පක්ෂය (නසසප) සහ එක්සත් සමාජවාදී පක්ෂය (එසප) මත ය. ඔවුහු යුද්ධයේ විරුද්ධවාදීන් සහ සමාජවාදයේ ආධාරකරුවන් ලෙස ප්‍රෝඩාකාරීව පෙනී සිටිති. එහෙත්, ප්‍රධාන ධනේශ්වර පක්ෂ සමග අවස්ථාවාදී උපාමාරුවල යෙදීමේ ඔවුන්ගේ දීර්ඝ හා තුච්ඡ ඉතිහාසය මගින් පෙන්නුම් කෙරෙන පරිදි, ඔවුහු ස්වාධීන කම්කරු පන්තික දේශපාලනයට ඓන්ද්‍රියවම සතුරුය.

මේ වසර මුලදී එජාපයේ ප්‍රෝඩාකාරී "නිදහසේ වේදිකාවට" එක්වීමෙන් පසුව, නසසප හා එසප දැන් ප්‍රකාශ කර සිටින්නේ ජනාධිපතිවරනයට ඉදිරිපත් වීමේ ඔවුන්ගේ එල්ලය ෆොන්සේකා හෝ රාජපක්ෂ පලමු වටයෙන් ජයග්‍රහනය කිරීම වැලැක්වීම බවයි. ඔවුන් සූදානම් වන්නේ, මැතිවරනය දෙවන වටයකට යාමට සිදු වුව හොත් "අඩු නපුර" ලෙස ඒ හෝ මේ ධනේශ්වර අපේක්ෂකයාට සහයෝගය දීමටයි. ඔවුන් මීට පෙර සෑම අවස්ථාවක ම කරඇත්තේ ද මෙ අයුරින් 'අඩු නපුර' ලෙස ධනේශ්වර අපේක්ෂකයන්ට සහාය පිදීම ය. දේශපාලන සංස්ථාපිතයට මුලුමනින්ම බැඳී ගැතිවී සිටින, මැතිවරනමය මුග්ධත්වයේ මෙම පෙරකදෝරුවෝ, මහජන අතෘප්තිය හරවා නොමග යැවීම සඳහා තීරනාත්මක කානු ලෙස ධනේශ්වරයට සේවය කරති.

## දකුනු ආසියාවේ සමාජවාදය සඳහා අරගලය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව තුල අද සදේහව පවතින ජාත්‍යන්තර සමාජවාදයේ ශ්‍රේෂ්ට මූලධර්ම මත සසප පාදක වී සිටී.

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ලෙනින් හා ට්‍රොට්ස්කි 1917 රුසියානු විප්ලවයට නායකත්වය දීමේ දී පාදක වූ වැඩපිලිවෙල ආරක්ෂා කරයි. ඒවනාහී, මනුෂ්‍ය වර්ගයා ධනවාදයෙන් හා පන්ති පීඩනයෙන් විමුක්ත කරගැනීමේ ලෝක සමාජවාදී විප්ලවයේ වැඩපිලිවෙලයි. නැග එන තත්වාරක්ෂක පාලක කුලයක්වූ සිය අවශ්‍යතා ආරක්ෂා කරගනු පිනිස සෝවියට් සංගමයේ දේශපාලන බලය උදුරාගෙන "තනි රටක සමාජවාදය" පිලිබඳ මාක්ස්වාදී-විරෝධී ඉදිරිදර්ශනය ඉදිරිපත් කල ස්ටැලින්වාදී නිලධරයේ පාවාදීම්වලට එරෙහිව සටන් වැදීම සඳහා, ට්‍රොට්ස්කි 1938 දී හතර වන ජාත්‍යන්තරය පිහිටුවිය. ස්ටැලින්වාදයට එරෙහි ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ අරගලය තීරනාත්මකව සනාථ වූයේ 1991 දී ය, එනම් ස්ටැලින්වාදීන් සමාජවාදය විවෘතව හැරපියා සෝවියට් සංගමය බිඳ දමා ධනවාදය පුනස්ථාපනය කල කල්හිය.

සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා අරගලය අඛන්ඩව ඉදිරියට ගෙන ගිය කම්කරු පන්තියේ වඩා දුර දිග දක්නා නියෝජිතයන්ගේ උරුමය මත සසප පාදක වී සිටී. 1940 ගනන්වල දී, ඉන්දියානු බෝල්ශේවික් ලෙනින්වාදී පක්ෂයේ (බීඑල්පීඅයි) ට්‍රොට්ස්කිවාදියෝ, ඉන්දු උප මහාද්වීපයේ කම්කරු පන්තිය හා පීඩිත මහජනතාව සඳහා ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ඉදිරිදර්ශනයක් වර්ධනය කරමින්, දකුනු ආසියාවේ කම්කරු පන්තිය තුල ගැඹුරට මුල් බැස ගත්හ. පසු කලෙක 1964 දී ලසසප ධනේශ්වර සභාග ආන්ඩුවකට ඇතුලුවීම සමාජවාදයට ද ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ එකමුතුවට ද ප්‍රධාන ප්‍රහාරයක් එල්ල කලේය.

සසප පෙරගමන්කරුවා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස), ලසසප පාවාදීමට එරෙහි ඍජු දේශපාලන අරගලයක් තුල, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව ලෙස 1968 දී පිහිටුවන ලදි. දශක හතරකට වැඩි කලක් තිස්සේ, විකොස සහ සසප, ධනේශ්වර වර්ගෝත්තමවාදයට, එනම්, රාජ්‍ය භාෂාව ලෙස සිංහල ද රාජ්‍ය ආගම ලෙස බුද්ධාගම ද සංස්ථාපිත කිරීමට, ජවිපෙ ව්‍යාජ-ජනතාවාදී සිංහල ස්වෝත්තමවාදයට සහ ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ ලේ වැගිරීමට, අශමනීය ලෙස විරුද්ධ වී තිබේ. දකුනු ආසියාව පුරා හා ජාත්‍යන්තර පරිමානව පන්ති අරගලය පුනර්ජීවනය වන තතු තුල, මෙම අරගලවල පාඩම් කම්කරු පන්තිය සඳහා අත්‍යවශ්‍ය දේශපාලනික මං සලකුනු සම්පාදනය කරනු ඇත.

අපගේ ක්‍රියාමාර්ගයට හා ඉදිරිදර්ශනයට සහයෝගය දෙන සියල්ලන්ගෙන්ම අප ඉල්ලා සිටින්නේ අපගේ මැතිවරන උද්ඝෝෂනයට ක්‍රියාකාරීව සහභාගි වන ලෙසයි. මෙයින් අදහස් කෙරෙන්නේ, අපගේ අපේක්ෂකයා හා රැස්වීම් ප්‍රචාරය කිරීමට සහයෝගය දීම, අපගේ මැතිවරන ප්‍රකාශන බෙදා හැරීම හා ඒවා සාකච්ඡා කිරීම සහ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ අන්තර්ජාල ප්‍රකාශනය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සඳහා හැකි පුලුල්ම පාඨකත්වයක් ප්‍රවර්ධනය කිරීමයි. අන් සියල්ලටමත් වඩා අප ඔබගෙන් ඉල්ලා සිටින්නේ, සමාජවාදී සමානතා පක්ෂයට බැඳී කම්කරු පන්තියේ මහජන පක්ෂය ලෙස එය ගොඩනැගීමට එක්වන ලෙසයි.

© www.wsws.org